Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - පෙරදිග සංගීතය

සතිය - 08 වන සතිය

ශ්‍රේණිය - 07

සැකසුම - අචලා දිසානායක මිය
ර/බළ/ආනන්ද මෛත්‍රෙය මධ්‍ය මහා විද්‍යාලය

## පාඩම :- වාද්‍ය භාණ්ඩයෙන් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය.

වාද්‍ය භාණ්ඩ තෝරා ගත් පසු එහි ව්‍යුහය, ස්වර පිහිටීම ඉගෙනීම ඉතා වැදගත්ය. එමෙන්ම ආධුනිකයෙකු සංගීත භාණ්ඩ වාදනයේ දී පළමුව සිදු කළ යුත්තේ ස්වර අභ්‍යාස වාදනයයි. මෙම පාඩමේ දී වාද්‍ය භාණ්ඩකින් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය කරන ආකාරය විමසා බලමු.

- තාලානුකූල ස්වර අභ්‍යාස වාදනයෙන්,
  - භාණ්ඩ වාදනය හුරු වීම.
  - රිද්මය පිළිබඳ අවබෝධය දියුණු වීම.
  - සංගීත භාණ්ඩ හොඳින් හැසිරවීමට පුහුණු වීම.
  - තාලානුකූලව වාදනයට උත්සාහ කිරීම.

**<u>වයලීනයෙන් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය.</u>**

- ∏ - Down Bow - මෙම සළකුණ යොදා ඇති ස්වරය බෝව පහළට අදිමින් වාදනය කළ යුතුයි.

- V - Up Bow - මෙම සළකුණ යොදා ඇති ස්වරය බෝව ඉහළට අදිමින් වාදනය කළ යුතුයි.

- එක ස්වරයක් වාදනය කිරීමේ දී එක් Bow (අඵව) පහරක් ඉහළට හෝ පහළට අදිමින් වාදනය කළ යුතුය. එය සංකේතවත් වනුයේ පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| ∏ | V | ∏ | V |
| ස | රි | ග | ප |

- මෙහිදී එක් ස්වරයකට එක් බෝවක් භාවිතා කරයි.

| | | | |
|---|---|---|---|
| V | | | |
| ස | රි | ග | ප |

- මෙලෙස මුල් ස්වරය මත සංකේතවත් වූ විට ස්වර සියල්ල එක් බෝ පහරකින් ඉහළට අඵව ගමන් කරවමින් වාදනය කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| ∏ | | V | |
| ස | රි | ග | ප |

- ඉහත ස්වර ඛණ්ඩයම අළු දෙකකින් වාදනය කරනු ලැබේ. ස රි ස්වර පහළට බෝව යොදා ගනිමින් හා ග ප ස්වර ඉහළට බෝව යොදා ගනිමින් වාදනය කරනු ලැබේ.

ඉහත ක්‍රියාකාරකම් හොඳින් අධ්‍යයනය කර පහත අභ්‍යාස වාදනය කරන්න.

01.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ∏ | | | | V | | | | ∏ | | | | V | | | |
| ස | - | - | - | රි | - | - | - | ග | - | - | - | ම | - | - | - |
| ∏ | | | | V | | | | ∏ | | | | V | | | |
| ප | - | - | - | ධ | - | - | - | නි | - | - | - | ස̇ | - | - | - |
| ∏ | | | | V | | | | ∏ | | | | V | | | |
| ස̇ | - | - | - | නි | - | - | - | ධ | - | - | - | ප | - | - | - |
| ∏ | | | | V | | | | ∏ | | | | V | | | |
| ම | - | - | - | ග | - | - | - | රි | - | - | - | ස | - | - | - |

02.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ∏ | | V | | ∏ | | V | | ∏ | | V | | ∏ | | V | |
| ස | - | රි | - | ග | - | ම | - | ප | - | ධ | - | නි | - | ස̇ | - |
| ∏ | | V | | ∏ | | V | | ∏ | | V | | ∏ | | V | |
| ස̇ | - | නි | - | ධ | - | ප | - | ම | - | ග | - | රි | - | ස | - |

03.

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ∏ | V | ∏ | V | ∏ | V | ∏ | V | ∏ | V | ∏ | V | ∏ | V | ∏ | V |
| I | ස | රි | ග | ම | ප | ධ | නි | ස̇ | ස̇ | නි | ධ | ප | ම | ග | රි | ස |
| | ∏ | | V | | ∏ | | V | | ∏ | | V | | ∏ | | V | |
| II | ස | රි | ග | ම | ප | ධ | නි | ස̇ | ස̇ | නි | ධ | ප | ම | ග | රි | ස |
| | ∏ | | | | V | | | | ∏ | | | | V | | | |
| III | ස | රි | ග | ම | ප | ධ | නි | ස̇ | ස̇ | නි | ධ | ප | ම | ග | රි | ස |

- සිතාරය, ගිටාරය, එස්රාජය වැනි භාණ්ඩ වාදනයේ දී යොදා ගත හැකි තාලානුකූල ස්වර අභ්‍යාස පිළිබඳ අධ්‍යයනය කරන්න.

- ස්වර අෂ්ඨකය ඇසුරින් වෙනත් තාලානුකූල ස්වර අභ්‍යාස නිර්මාණය කර වාදනය කරන්න.